සියලුම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved



අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය විභාගය 2020
# General Certificate of education (Adv. Level) Examination 2020

13 ශ්‍රේණිය තුන්වන වාර පරීක්ෂණය 2020 අගෝස්තු
Grade 13-3rd Term Test – 2020 August

කාලය පැය 03
03 hours

33 S II

**ගිණුම්කරණය II**
**Accounting II**

**අමතර කියවීම් කාලය : මිනිත්තු 10 යි.**
**Additional Reading Time : 10 minutes**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස් :
- පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

1. සීමිත බිම්සර සමාගමේ බදු පෙර ශුද්ධ ලාභය ගණනය කිරීමෙන් පසු 2020/3/31 ට පහත ශේෂ පිරික්සුම ඔබට දී ඇත. මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂවරු අත්සන් කළ දිනය 2020/6/30 වන අතර එම මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කළ දිනය 2020/7/20 දින වේ. (රු.000)

| | | |
|---|---|---|
| දේපල පිරියත හා උපකරණ ධාරණ අගය | 3 500 | |
| වෙළඳ ලැබිය යුතු දෑ | 300 | |
| මුදල් හා සමාන දෑ 2020 | 1 150 | |
| ඉතිරි තොගය | 200 | |
| 12% ආයෝජන | 800 | |
| කල්බදු ණය වාරික | 300 | |
| ආදායම් බදු වෙන් කිරීම (2019/3/31) | | 30 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 1030 |
| ප්‍රකාශිත සාමාන්‍ය ප්‍රාග්ධනය (රු. 100 කොටස්) | | 2 500 |
| රඳවාගත් ඉපැයීම් 2019/4/1 | | 300 |
| ප්‍රත්‍යාගණන සංචිත ගොඩනැගිලි | | 300 |
| ගෙවූ ලාභාංශ | 160 | |
| ගෙවූ ආදායම් බදු | 90 | |
| වගකීම් සහතික වෙන් කිරීම (2019/3/31) | | 70 |
| හානිකරණ අලාභ සඳහා ඉඩහැරීම (2019/3/31) | | 120 |
| බදු පෙර ශුද්ධ ලාභය 2020/3/31 | | 2 000 |
| විකුණුම් අත්තිකාරම් | | 150 |
| | 6 500 | 6 500 |

.22 A/L අපි [ papers grp ]



Scanned with CamScanner

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පහත කරුණු සැලකිල්ලට ගත යුතු වේ.

(1) ආදායම් ප්‍රකාශනයෙහි සංක්ෂිප්තය පහත දී ඇත. රු. 000

| | |
|---|---|
| විකුණුම් | 4 000 |
| විකුණුම් පිරිවැය | (1 240) |
| බෙදාහැරීම් වියදම් | ( 460) |
| පරිපාලන වියදම් | ( 300) |
| | (2 000) |
| කාලච්ජේදය බදු පෙර ලාභය | 2 000 |

(2) දේපල පිරියත හා උපකරණ සංයුතිය (2019/4/1) (රු.000)

| | පිරිවැය/ ප්‍රත්‍යාගණන අගය | සමුච්චිත ක්ෂය වෙන් කිරීම | ධාරණ වටිනාකම |
|---|---|---|---|
| ගොඩනැගිලි | 2 000 | 200 | 1 800 |
| වැන් රථ භාවිත හිමිකම | 1 500 | - | 1 500 |
| උපකරණ | 500 | 300 | 200 |
| | 4 000 | 500 | 3 500 |

- ගොඩනැගිලි වසරකට 10% බැගින් ද උපකරණ 20% බැගින් ද සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි.
- 2020/3/31 දින ගොඩනැගිලි රු. 1 300 000 කට නැවත ප්‍රත්‍යාගණනය කර ඇතත් ගිණුම් තබා නැත.

(3) 19/4/1 වැන් රථය භාවිත හිමිකමක් සහිතව භාවිතයට ගෙන ඇත. සෘජු වියදම් හා මූලික ගෙවීම් 2019/4/1 ගෙවා නිවැරදිව වාර්තා කර ඇත. ආරම්භක කල්බදු වගකීම වන රු. 900 000 ක් වෙළඳ ගෙවිය යුතු ගිණුමට බැර කර ඇත. කල්බදු කාලය වසර 4 ක් වන අතර පොලී ප්‍රතිශතය 10% කි. ජීව කාලය වසර 5 කි. වත්කම කල්බදු කාලය අවසානයේ සමාගමට හිමි වේ. 2020/3/31 ගෙවූ පළමු වාරිකය තුළ කල්බදු ණය ගිණුමට හර කර ඇත. සෑම කල්බදු වාරිකයම වාර්ෂික ණය සමාන වේ. (ප්‍රාග්ධන වැය)

(4) පරිපාලන වියදම් තුළ වර්ෂයේ සේවක ශුද්ධ වැටුප් මුදලින් ගෙවීම රු. 260 000 ඇතුළත් වේ. සේවක වැටුප්වලින් සේවක EPF 10% හා සේවක පෞද්ගලික වාහන ණය වාරිකයක් රු. 10 000 අඩු කර ශුද්ධ වැටුප පමණක් පරිපාලන වියදම් තුළ ඇතුළත්ව ඇත. සේවක EPF 10% හා සේව්‍ය EPF 15% හා ETF 3% වේ.

(5) පිරිවැයට 25% ක ලාභ ප්‍රතිශතයක් එකතු කොට විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යැවූ රු. 100 000 කට විකුණා ඇති භාණ්ඩ විකුණුම් ලෙස ගිණුම්ගත කොට ඇතත් කිසියක් විකිණී නොමැත. ගබඩාවේ ඇති තොගවල ශුද්ධ උපලබ්ධි අගය රු. 180 000.

(6) වෙළඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ සඳහා ඉඩහැරීමේ ප්‍රතිශතය 10% කි. ආයෝජන අරඹා ඇත්තේ 2020/1/01 දිනය.

(7) 2019/2019 අවසන් කාර්තුව සඳහා එකඟ වී ගෙවූ බදු රු. 50 000 ක් ගෙවූ බදු තුළ ඇතුළත් අතර වසරේ බදු තක්සේරුව බදු පෙර ලාභයෙන් 10% ක් වේ.

(8) 2020/3/31 දිනට හිමි සෑම කොටස් 5 කටම 2 ක් ලෙස රු. 50 හිමිකම් නිකුත් කර ඇතත් ගිණුම් තබා නැත. රඳවාගත් ඉපැයීම්වලින් රු. 100 000 ක් පොදු සංචිතයට මාරු කළ යුතුයි.



Scanned with CamScanner

(9) සමාගම වගකීම් සහතික නිකුත්කරන්නේ වසරක් සඳහා වන අතර ප්‍රතිපාදනය රු. 80 000 කි. පසුගිය වසරේ නිකුත්කල වගකීම් මත රු. 60 000 ක ගෙවීම් බෙදා හැරීම් වියදම් තුළ ඇතුළත්ය.

(10) 2020/3/31 දිනට විකුණුම් අත්තිකාරම් ගිණුමේ ශේෂය 1 500 000 වන අතර ගනුදෙනුකරුවන් විසින් පහත විකුණුම් අගයන් අත්තිකාරම් මත සිදු කර ඇති අතර විකුණුම් අගයන් හඳුනාගෙන නැත.

| විකුණුම් අත්තිකාරම් ලද දිනය | විකුණුම් කළ දිනය |
|---|---|
| 2020/01/01 | 2020/03/30 රු. 50 000 |
| 2020/03/01 | 2020/04/20 රු. 60 000 |
| 2020/03/28 | 2020/04/30 රු. 40 000 |

**අවශ්‍ය වන්නේ,**

(LKAS 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ගිණුම්කරණයට අනුව) 2020/3/31 දිනෙන් අවසන්

1) ලාභ අලාභ ගිණුම හා වෙනත් විස්තීර්ණ ආදායම
2) 2020/3/31 දිනෙන් අවසන් වර්ෂයේ හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය
3) 2020/3/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය (සටහන් ඇතුළු)

(මුළු ලකුණු 40)

2. (අ) සීමිත නිම්සර පොදු සමාගම එකලස් හා නිමැවුම් ලෙස නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහිත කර්මාන්ත ශාලාවක් හා ගබඩාවක් වෙන වෙනම පවත්වාගෙන යයි. මෙහි x හා y ලෙස වර්ග දෙකක භාණ්ඩ නිපදවන අතර ඒවා නිපදවීමේදී නිෂ්පාදන දෙපාර්තමේන්තු හා සේවා අංශයක් පවත්වා ගැනේ. අයවැයගත පොදු කාර්ය පිරිවැය පහත දී ඇත.

(රු.000)

වක්‍ර අමුද්‍රව්‍ය - එකලස් ---------------140
නිමැවුම්--------------- -30
ගබඩාව ----------- -----20
වක්‍ර වේතන - කර්මාන්තශාලාව--------160
ගබඩාව ----------------50
ගොඩනැගිලි කුලී- කර්මාන්තශාලාව---100
ගබඩාව ----------------80
යන්ත්‍ර ක්ෂය ---------------------------160
නිෂ්පාදන නොවන පොදුකාර්ය -------500

අතිරේක තොරතුරු

1.

| විස්තරය | එකලස් | නිමැවුම් | ගබඩාව | එකතුව |
|---|---|---|---|---|
| යන්ත්‍ර පිරිවැය රු. | 250 000 | 150 000 | - | 400 000 |
| බිම් ප්‍රමාණය (වර්ග මීටර්) | 120 | 80 | 160 | 360 |
| සේවක සංඛ්‍යාව | 50 | 30 | 25 | 105 |
| ද්‍රව්‍ය අධියාචනාපත් ගණන | 30 | 15 | - | 45 |

.22 A/L අපි [ papers grp ]



Scanned with CamScanner

2. නිපදවන භාණ්ඩ වර්ග දෙකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | x | y |
|---|---|---|
| ඒකකයක සෘජු ද්‍රව්‍ය පිරිවැය රු | 300 | 340 |
| සෘජු ශ්‍රම පිරිවැය රු. | 160 | 200 |
| ඒකකයක අයවැයගත යන්ත්‍ර පැය | 4 | 4 |
| සෘජු ශ්‍රම පැය | 2 | 3 |
| අයවැයගත නිෂ්පාදන ඒකක ගණන | 2000 | 3000 |

3. එකලස් දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය මතද, නිමැවුම් දෙපාර්තමේන්තුව ශ්‍රම පැය මතද පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරයි.

**අවශ්‍ය වන්නේ,**

1) නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය විභජන පත්‍රිකාව (සේවා විභජනය සමඟ)
2) එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුවල අන්තර්ග්‍රහණ අනුපාත
3) x හා y භාණ්ඩ සඳහා ඒකකයක නිෂ්පාදන පිරිවැය
4) x භාණ්ඩයෙහි ඒකකයක මුළු පිරිවැය (ලකුණු 20)

(ආ) දිනුක සමාගම විසින් පවතින යන්ත්‍රය වෙනුවට නව තාක්ෂණික යන්ත්‍රයක් මිලට ගැනීමට සලකා බලමින් සිටි නව යන්ත්‍රයේ අපේක්ෂිත පිරිවැය පහත පරිදි වේ. (රු.000)

| | |
|---|---|
| ගැනුම් මිල | 1 800 |
| යන්ත්‍ර සවිකිරීමේ පිරිවැය | 300 |
| යන්ත්‍ර ප්‍රවාහන පිරිවැය | 100 |

පහත තොරතුරු අදාල වේ.

1. නව යන්ත්‍රය මිලට ගත්විට පවතින කාරක ප්‍රාග්ධනය රු. 250 000 - රු. 350 000 දක්වා වැඩි වේ. මුළු පිරිවැය ව්‍යාපෘති කාලයෙන් පසු හිමි වේ.
2. පැරණි යන්ත්‍රයේ සුන්බුන් අගය රු. 300 000 ක් වන අතර නව යන්ත්‍රයේ සුන්බුන් අගය රු. 200 000 කි.
3. නව යන්ත්‍රයේ ජීව කාලය මෙන්ම පැරණි යන්ත්‍රයේ ඉදිරි ජීව කාලය ද වසර 4 කි.
4. යන්ත්‍ර දෙකට අදාළ ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයන් පහත දැක්වේ.

| වර්ෂය | මුදල් ගලාඒමේ මිල (රු. 000) | | මුදල් ගලායාම (රු. 000) | |
|---|---|---|---|---|
| | නව යන්ත්‍රය | පැරණි යන්ත්‍රය | නව යන්ත්‍රය | පැරණි යන්ත්‍රය |
| 1 | 1 200 | 500 | 300 | 200 |
| 2 | 1 400 | 600 | 400 | 250 |
| 3 | 2 100 | 1 400 | 600 | 450 |
| 4 | 2 000 | 1 200 | 500 | 400 |

5. 10% අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය මත වට්ටම් සාධක පහත දැක්වේ.

| වර්ෂය | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| වට්ටම් සාධක | 0.9 | 0.8 | 0.7 | 0.6 |



Scanned with CamScanner

**අවශ්‍ය වන්නේ,**

1) මුදල් ප්‍රවාහ ඇස්තමේන්තුව

2) පහත ශිල්ප ක්‍රම තුනට අදාළ අගයන් හා නව යන්ත්‍රය මිලට ගැනීම යෝග්‍ය, අයෝග්‍ය බව හේතු සහිතව දක්වන්න.

1. පිලිගෙවුම් කාලය (PBP)
2. ශුද්ධ වර්තමාන අගය (NPV)
3. ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය (ARR) (ලකුණු 20)

(මුළු ලකුණු 40)

3. 2019/04/01 දින සී/ස රුහුණු ව්‍යාපාරය පැවති වත්කම් හා වගකීම් ශේෂ පහත දැක්වේ.

රු. 000

| | |
|---|---|
| දේපල පිරියත හා උපකරණ | 800 |
| තොගය | 400 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 300 |
| බැංකු ශේෂය | 200 |
| | 1 700 |
| ප්‍රාග්ධනය | 850 |
| රඳවාගත් ඉපයුම් | 400 |
| වගකීම් | 450 |
| | 1 700 |

.22 A/L අහි [ papers grp ]

2019 අප්‍රේල මාසය තුළ පහත ගනුදෙනු සිදුවිය.

1) රු. 400 000 ක් වටිනා භාණ්ඩ තොග ලබාගෙන ඉන් 40% ක් එදිනම මුදල් ගෙවා ඇත.
2) පිරිවැය රු. 200 000 ක් වන භාණ්ඩ තොගයක් විකුණුම් මිලට 20% ක ලාභ තබාගෙන ණයට විකුණා ඇත.
3) රු. 120 000 ක් වටිනා ලී බඩු මුදල් ගෙවා ලබා ගැනීම.
4) අංක 02 ගනුදෙනුවලට අදාල භාණ්ඩ වලින් තොගයක් විකුණුම් මිලට 20% ක ලාභ තබාගෙන අත්පිට මුදලට විකුණා ඇත.
5) පිරිවැය රු. 300 000 ක් වන භාණ්ඩ තොගයක් විකුණුම් මිලට 20% ක ලාභ තබාගෙන අත්පිට මුදලට විකුණා ඇත.
6) 2019 අප්‍රේල් මාසය තුළ ගෙවා ඇති විදුලිය බිල් හා වැටුප් පිළිවෙළින් රු. 20 000 ක් හා රු. 80 000 ක් වේ.
7) 10% ක වට්ටමකට යටත්ව රු. 108 000 ක් ණයහිමියන්ට ගෙවා ඇත.
8) 2019 අප්‍රේල් මාසය තුළ ගෙවූ බැංකු ණය වාරිකය රු. 50 000 කි. එහි අඩංගු පොලිය රු. 10 000 කි.
9) 2019/4/23 දින විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යවා ඇති භාණ්ඩවල ඉන්වොයිස් මිල රු. 104 000 කි. මෙම භාණ්ඩ ඉන්වොයිස් කරන ලද්දේ පිරිවැයට 30% ක ලාභයක් ලැබෙන පරිදිය. මෙම භාණ්ඩවලින් 40% ක භාණ්ඩ තොගයක් 2019/4/30 දින වන විට අලෙවි කර ඇති බව දක්වා ඇත. ඉතිරිය තවමත් විකුණා නැත.
10) 2019/4/25 දින පිරිවැය 20 000 ක් වන භාණ්ඩ තොගයක් හානි වී ඇති අතර ඉන් 80% ක් රක්ෂණ ආයතනය වන්දි ලබාදීමට එකඟ වී ඇත.

අතිරේක තොරතුරු

1) 2019/3/31 දින ගෙවීමට ඉදිරිපත් නොකල චෙක් පතක අගය රු. 10 000 ක් වූ අතර නිශ්කාශනය නොවූ චෙක්වල අගය රු. 15 000 ක් විය.
2) 2020 අප්‍රේල් මාසයේ බැංකු ප්‍රකාශයේ සඳහන් තොරතුරු මෙසේය.



Scanned with CamScanner

| | | |
|---|---|---|
| | රු. | |
| මාසය තුළ නිශ්කාශනය වූ චෙක් | 250 000 | |
| මාසය තුළ ගෙවීමට ඉදිරිපත් වූ චෙක් | 300 000 | |
| බැංකු ගාස්තු | 30 000 | |
| සෘජු ණයගැති ප්‍රේශණ | 60 000 | |
| ස්ථාවර නියෝග මත ගෙවීම් | 10 000 | |

2020 මාර්තු මාසයේ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් හා නිෂ්කාශනය නොවූ චෙක් 2020 අප්‍රේල් මාසයේ ගෙවා හා නිෂ්කාශනය වී ඇති බව හඳුනා ගැනුනි.

**අවශ්‍ය වන්නේ,**

(1) ඉහත අංක 1-10 දක්වා දී ඇති ගනුදෙනු පහත ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න. (ආරම්භක ශේෂයක්ද ගිණුම්කරණ සමීකරණයේ දක්වන්න.)

| ගනුදෙනුව | දේපල පිරියත උපකරණ | තොග | වෙළඳ ලැබිය යුතු දෑ | බැංකු ශේෂය | ප්‍රාග්ධනය | රඳවාගත් ඉපයුම | වගකීම් |
|---|---|---|---|---|---|---|---|
| ශේෂය 2020 අප්‍රේල් 1 | | | | | | | |

(2) 2020/4/30 දිනට සංශෝධිත බැංකු ගිණුම

(3) 2020/4/30 දිනට බැංකු සැසඳුම් පත්‍රය

(4) 2020/4/30 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(මුළු ලකුණු 40)

04. (අ) අචිනි භාග්‍යා සහ චමරි පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ 2020/3/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය පිළියෙල කර ඇත. එහි කෙටුම්පත් ශුද්ධ ලාභය රු. 930 000 ක් වේ. ලාභය ගණනය කළ පසුව කරන ලද ගිණුම් පරීක්ෂාවේදී පහත සඳහන් වැරදි සොයාගෙන ඇත.

1) 2020/3/31 දින තොගය රු. 50 000 ක් වැඩි ගණනට ගෙන ඇත.
2) අචිනිට රු. 30 000 ක් ද චමරිට රු. 20 000 ක් ද බැගින් ගෙවූ හවුල් වේතන පරිපාලන වියදම් ලෙස සටහන් කර ඇත.
3) වර්ෂය අවසානයේදී ලාභයෙන් අඩුකර ඇති හානිකරන අලාභ සඳහා ඉඩහැරීම වියදම රු. 7 000 කි. සෑම වසරකම අවසානයේ ඇති ණයගැති ශේෂය මත 10% ක් වන ලෙස සඳහා හානිකරන අලාභ ඉඩ හැරීම් සිදු කෙරේ. 2019/4/1 දිනට ණයගැති ශේෂය රු. 30 000 කි. එහෙත් වර්ෂය තුළදී සිදු වී ඇති රු. 20 000 ක හානිකරන අලාභ ගිණුම්ගත වී නැත.
4) භාග්‍යා 2019/10/1 දින යොදා ඇති රු. 200 000 ක් හා චමරි 2020/01/01 දින යොදා ඇති රු. 100 000 ක අමතර ප්‍රාග්ධනය යෙදවීම පොත්වල සටහන් කර නැත.
5) අචිනි හා චමරි වර්ෂය තුළ සිදු කර රු. 10 000 ක් හා රු. 20 000 ක් වන භාණ්ඩ ගැනිලි පොත්වල සටහන් වී නැත.

හවුල් ගිවිසුමේ ඇතුළත් කොන්දේසි පහත දැක්වේ.

1. 2019.04.01 දිනට හවුල්කරුවන්ගේ හිමිකම්

| | ප්‍රාග්ධනය | ජංගම ගිණුම් | රු. 000 |
|---|---|---|---|
| අචිනි | 400 | 180 | |
| භාග්‍යා | 300 | 100 | |
| චමරි | 200 | 80 | |



Scanned with CamScanner

2. වාර්ෂික ප්‍රාග්ධන පොලී අනුපාතිකය 10% කි.
3. හවුල්කරුවන්ගේ මාසික හවුල් වේතන පහත දැක්වේ.

| | රු. |
|---|---|
| අචිනි | 10 000 |
| භාග්‍යා | 12 000 |
| චමරි | 10 000 |

4. අචිනි, භාග්‍යා හා චමරි අතර ලාභ අනුපාතය 3:2:1 ක් වේ.
5. හවුල්කරුවෙකු ඉවත්වීමේදී මුළු කීර්තිනාමය ප්‍රාග්ධණ ගිණුම්වලින් ගැලපිය යුතු අතර ශේෂයක් පවත්වා නොගැනේ.

2020/03/31 දින හවුල්ව්‍යාපාරයෙන් අචිනි ඉවත් විය. ඇයගේ මුළු හිමිකම ණය ගිණුමකට මාරු කළ යුතු අතර එම ණය සඳහා වාර්ෂිකව 10% ක පොළියක් ඇයට හිමිවේ. 2020/03/31 දින මෙම ණය ගිණුමෙන් 1/4 ක් මුදලින් ගෙවා ඇත. භාග්‍ය හා චමරිගේ නව ලාභ අනුපාතය සම සමව වන අතර 2020/03/31 දින හවුල් ව්‍යාපාරයේ අචිනිගේ කීර්තිනාම කොටස රු. 60 000 ක් ලෙස ඇස්තමේන්තු කරයි.

**අවශ්‍ය වන්නේ,**

1) 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ ලාභ විසර්ජන ප්‍රකාශය
2) 2020/03/31 දිනෙන් අවසන් වසර සඳහා ප්‍රාග්ධන හා ජංගම ගිණුම
3) අචිනිගේ ණය ගිණුම

(ලකුණු 20)

(ආ) ශනීශා ප්‍රවාහන සේවා ආයතනය කටුනායක ගුවන් තොටුපලට හා ගුවන් තොටුපලේ සිට මගී ප්‍රවාහන සේවාවක් අලුතින් ආරම්භ කිරීමට සැලසුම් කරමින් සිටී. මේ සඳහා අදාල වන තොරතුරු පහත දැක්වේ.

1) රු. 4 000 000 ක් බැගින් වන වාහන 4 ක් මේ සඳහා භාවිතා කරන අතර ඒවායේ ජීව කාලය වර්ෂ 8 ක් බැගින් වේ. වාහනයකට වැයවන වාර්ෂික රක්ෂණ ගාස්තුව හා වාර්ෂික සේවා ගාස්තුව පිළිවෙළින් රු. 60 000 ක් හා රු. 40 000 ක් වේ.
2) මගියෙකුගෙන් 1km ක් සඳහා රු. 80 ක ස්ථාවර ගාස්තුවක් අය කරනු ලැබේ.
3) ඉන්ධන ලීටරයකින් ධාවනය කළ හැකි කිලෝමීටර් ගණන 8න කි. ඉන්ධන ලීටරයක් රු. 160 ක් ලෙස ස්ථාවර අගයක් ගනී.
4) රියදුරෙකුගේ මාසික දීමනාව රු. 15 000 කි. මීට අමතරව ධාවනය කරන සෑම 1km ක් සඳහාම රියදුරෙකුට රු. 30 ක දිරි දීමනාවක් ගෙවනු ලැබේ. රියදුරන් 4 දෙනෙකු සේවයේ යෙදී ඇත.
5) මාසික අපේක්ෂිත ධාවන කිලෝමීටර් ගණන 15 000 කි.

**අවශ්‍ය වන්නේ,**

(1) මෙම ව්‍යාපෘතියේ ස්ථාවර පිරිවැය ගණනය කරන්න.
(2) ලාභ හෝ අලාභ නොලබා මෙම සේවාව පවත්වාගෙන යාමට නම් කොපමණ කිලෝමීටර් ගණනක් වර්ෂයකට ධාවනය කළ යුතුද?
(3) ආරක්ෂක ආන්තිකයට අදාල කිලෝමීටර් ගණන කොපමණ ද?
(4) වර්ෂය තුළ 100 000 km ක් ධාවනය කලහොත් අපේක්ෂිත ලාභය කොපමණ ද?
(5) රු. 2 100 000 ක ලාභයක් ලැබීමට නම් ධාවනය කළ යුතු කිලෝමීටර් ගණන කොපමණ ද?
(6) ඉදිරියේදී ඉන්ධන 1km ක මිල රු. 192 ක් හා රියදුරු දිරි දීමනාව 1km ක් සඳහා රු. 36 ක් දක්වා වැඩි වුවහොත් ඉහත ලාභයහ ලබා ගැනීමට ධාවනය කළ යුතු කිලෝමීටර් ගණන කොපමණ ද?

.22 A/L අපි [ papers grp ]



Scanned with CamScanner

05. (අ) සීමිත දුන්හිඳ සමාගම 2020/03/31 දිනට පහත තොරතුරු දක්වා ඇත. සමාගමේ ප්‍රථම මෙහෙයුම් කටයුතු 2019/04/01 දින ආරම්භ කර ඇත.

2020/03/31 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(රු.000)

| | | |
|---|---|---|
| දේපල පිරියත (ධාරන) | | 8 400 |
| උයෝජන 2019/07/01 (වාර්ෂික පොලිය 20% | | 1 000 |
| | | 9 400 |
| **ජංගම වත්කම්** | | |
| තොගය (ශුද්ධ උපලබ්ධි අගය) | 1 330 | |
| වෙළඳ ලැබිය යුතු ගිණුම් | 2 500 | |
| මුදල් | 100 | |
| | 2 500 | 6 430 |
| **හිමිකම** | | 15 830 |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | |
| රඳවාගත් ලාභය | 5 000 | |
| ප්‍රත්‍යාගණන සංචිතය | 4 400 | |
| | 600 | |
| **ජංගම නොවන වගකීම්** | | 10 000 |
| බැංකු ණය (2,3,4 වසර) | | |
| **ජංගම වගකීම්** | | 4 000 |
| බැංකු ණය වාරිකය (1 වසර) | 1 500 | |
| ආදායම් බදු වෙන්කිරීම | 20 | |
| වෙළඳ ගෙවිය යුතු ගිණුම් | 80 | |
| VAT | 200 | |
| බැංකු අයිරාව | 30 | 2 080 |
| | | 15 830 |

2020/03/31 දිනෙන් අවසන් වර්ෂය ලාභ අලාභ හා වෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| | |
|---|---|
| විකුණුම් | 17 000 |
| විකුණුම් පිරිවැය | 8 000 |
| දල ලාභය | 9 000 |
| ආයෝජන ලාභාංශ | 150 |
| මෙහෙයුම් වියදම් | (3 400) |
| ශුද්ධ ලාභය | 5 750 |
| ප්‍රත්‍යාගණන ලාභය | 600 |
| කාලච්ඡේද මුළු විස්තීර්ණ ආදායම | 6 350 |



Scanned with CamScanner

අතිරේක තොරතුරු

(1) මෙහෙයුම් වියදම් තුළ පහත අයිතමද ඇතුළත් කර ඇත.

| | රු. 000 |
|---|---|
| දේපල ක්ෂය | 200 |
| බැංකු පොලී වියදම | 500 |
| හානිකරන අලාභ | 60 |
| ආදායම් බදු වියදම | 150 |
| ගැනුම් අත්තිකාරම් | 140 |
| තොග කපා හැරීම් | 120 |

(2) දේපල පිරියත ප්‍රථම ප්‍රත්‍යාගණනය 2020/03/31 දින සිදුකර රු. 600 000 අතිරික්තයක් හඳුනාගෙන වාර්තා කර ඇත.

(3) බැංකු ණය ප්‍රථම වාරිකය රු. 1 500 000 උපචිත වේ.

(4) කොටස් කරුවන්ට වර්ෂය තුළ අතුරුලාභාංශ ගෙවීම සිදුකර ඇත.

**අවශ්‍ය වන්නේ,**

2020/03/31 දිනෙන් අවසන් වර්ෂයේ සීමිත දුන්හිඳ සමාගම LKAS 07 ගිණුම් ප්‍රමිතය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (වක්‍ර ක්‍රමයට සාදන්න) **(ලකුණු 20)**

(ආ) (1) සීමිත උදය සමාගම හා සීමිත ජෙනී සමාගම මූල්‍ය වාර්තා තොරතුරු පහත දැක්වේ.

.22 A/L අපි [ papers grp ]

(රු. 000)

| | උදය සමාගම | | ජෙනී සමාගම | |
|---|---|---|---|---|
| | 2020/03/31 | 2019/03/31 | 2020/03/31 | 2019/03/31 |
| දේපල පිරියත | 2 500 | 4 000 | 3 600 | 2 000 |
| තොගය | 600 | 800 | 600 | 1 000 |
| බැංකු ණය (10%) | 1 000 | - | 3 000 | 2 500 |
| ප්‍රාග්ධනය | 15 000 | 15 000 | 9 000 | 7 000 |
| රඳවාගත් ලාභ | 2 500 | 1 600 | 3 000 | 2 000 |
| කොටස් ගණන (අදහස්) | 300 | 300 | 200 | 1 000 |

2020/03/31 දිනෙන් අවසන් වර්ෂය (රු. 000)

| | උදය සමාගම | ජෙනී සමාගම |
|---|---|---|
| විකුණුම් | 20 000 | 40 000 |
| විකුණුම් පිරිවැය | 5 000 | 30 000 |
| බදු වියදම | 400 | 500 |

**අවශ්‍ය වන්නේ,**

(1) 1) උදය සමාගමේ 2019/20 වර්ෂය දල ලාභ අනුපාතය
2) ජෙනී සමාගම 2019/20 වර්ෂයේ තොග පිරිවැටුම් අනුපාතය
3) ජෙනී සමාගම 2019/3/31 දිනට ණය හිමිකම් අනුපාතය
4) උදය සමාගම 2019/2020 වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය
5) උදය සමාගම 2019/3/31 දිනට කොටසක ඉපයුම් අනුපාතය



Scanned with CamScanner

(2) 1) 2019/2020 වර්ෂයේ තොග ගබඩා තුළ වැඩි කාලයක් පවතින සමාගම කුමක් ද?
2) 2019/2020 පොලී ආවරණ අනුපාතය වැඩි අගය පවතින සමාගම කුමක් ද?
3) ආයෝජන වඩා සුදුසු සමාගම කුමක්ද?
4) උදය සමාගම දල ලාභ අනුපාතය වැඩි කිරීමට යෝජනා දෙකක් ලියන්න. **(ලකුණු 20)**

**( මුළු ලකුණු 40)**

**06.** (අ) කොළඹ නගරය අඩු ආදායම් ලාභීන්ගේ නිෂ්පාදන සුබ සාධක සංගමය 2019/01/01 දිනට සාරාංශ ගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත දැක්වේ.

| **විස්තරය** | (රු.000) |
|---|---|
| යන්ත්‍ර පිරිවැය (සමුච්චිත ක්ෂය වෙන් කිරීම රු. 50 000) | 750 |
| අමුද්‍රව්‍ය තොගය | 800 |
| අමුද්‍රව්‍ය ණයහිමි | 500 |
| ගැනුම් අත්තිකාරම් (අමුද්‍රව්‍ය) | 150 |
| මුදල් | 700 |
| හිඟ සාමාජික මුදල් | 30 |
| කලින් ලද සාමාජික මුදල් | 80 |
| යන්ත්‍ර සඳහා ලද විශේෂ අරමුදල් පරිත්‍යාගය | 400 |

**අතිරේක තොරතුරු**

1) යන්ත්‍ර මිලදී ගැනීමට ලද පරිත්‍යාගයෙන් රු. 300 000 යොදවා 2019/10/01 දින යන්ත්‍රයක් මිලට ගෙන ඇත. (සියලුම යන්ත්‍රවල ඵලදායි ජීව කාලය වසර 20 කි.)

2) 2018/12/20 දින ගෙවූ ගැනුම් අත්තිකාරම් වෙනුවෙන් රු. 120 000 භාණ්ඩ 2019/01/30 දින ව්‍යාපාරය භාරගෙන ඇත. ඉතිරි අත්තිකාරම් සඳහා භාණ්ඩ ලබාදීමට ප්‍රතික්ෂේප කර අදාල ආයතනයේ මුදල් ආපසු එවා ඇත.

3) සාමාජකයන් සියලුදෙනා සාමාන්‍ය සාමාජිකයන් වේ. ලියාපදිංචි වී ඇති සාමාජික ගණන 160 කි. වාර්ෂික සාමාජික මුදල රු. 2 000 ක් වේ. 2019/12/31 දින හිඟ තැබූ සාමාජික ගණන 8 ක් වන අතර 2020 වර්ෂය වෙනුවෙන් ගෙවූ සාමාජික ගණන 10 කි. වර්ෂයේ සාමාජික මුදල් ගෙවන සෘජු සේවකයන් 20 ක් තම මුදල් වැටුප්වලින් කපා ගන්නා ලෙස දක්වා ඇත.
2019 වර්ෂයේ නිෂ්පාදන කටයුතු වෙනුවෙන් පහත ගෙවීම් කර ඇත.

| | |
|---|---|
| ණයහිමි ගෙවීම් | රු. 1 500 000 |
| සෘජු වැටුප් ගෙවීම ශුද්ධ | රු. 200 000 |
| නිෂ්පාදන පොදුකාර්ය ගෙවීම | රු. 150 000 |
| විදුලිය කම්හල | රු. 80 000 |

වර්ෂයේ නිපද වූ සියලු ඒකක අත්පිට අලෙවි කළ අතර ආදායම රු. 5 000 000 වේ.

| **2019/12/31 දිනට ශේෂයන්** | **රු** |
|---|---|
| උපචිත කාර්යාල වියදම් | 50 000 |
| අමුද්‍රව්‍ය තොග | 100 000 |
| අමුද්‍රව්‍ය ණයහිමි | 200 000 |

**අවශ්‍ය වන්නේ,**

1. 2019/12/31 අවසන් වර්ෂය සඳහා මුදල් ගිණුම
2. 2019/12/31 ආදායම් ප්‍රකාශනය



Scanned with CamScanner

(රු.000)

| | |
|---|---|
| 2019/01/01 සමුච්චිත අරමුදල | |
| ර්ෂයේ ඌනතා අතිරික්තය | |
| ාන්ත්‍ර සඳහා විශේෂ අරමුදල් මාරු කිරීම් | |
| 2019/12/31 දිනට සමුච්චිත අරමුදල | |
| 2019/12/31 දිනට යන්ත්‍ර විශේෂ අරමුදල | |
| 2019/12/31 හිමිකම | |

.22 A/L අපි [ papers grp ]

(ලකුණු 20)

(ආ) "චිත්‍රා" නම් පින්තූර රාමු කිරීම හා අලෙවි ව්‍යාපාරයක තොරතුරු පහත දැක්වේ. 2020/01/01 දින අලුතින් ආරම්භ කල අතර පහත දෑ ව්‍යාපාරයට යොදවන ලදී.

| | රු. 000 |
|---|---|
| රාමුකරන ලද පෞද්ගලික චිත්‍ර තොගය | 160 |
| හිමිකරු සතු ගොඩනැගිල්ල | 300 |
| මුදල් | 650 |

2020 ජනවාරි අනෙකුත් ගනුදෙනු පහත දැක්වේ.

| දිනය | විස්තරය |
|---|---|
| 2020/01/01 | අත්පිට ගැනුම් එකක් රු. 60 බැගින් ඒකක 5 000 |
| 2020/01/03 | සේවක වැටුප් ගෙවීම රු. 80 000 |
| 2020/01/010 | ණයට ගැනුම් ඒකකයක් රු. 70 බැගින් ඒකක 2 000 (සේනක) |
| 2020/01/12 | ණයට ගැනුම් ඒකක රු. 80 බැගින් ඒකක 1 000 (විදුර) |
| 2020/01/12 | ණයට විකුණුම් එකක් රු. 300 බැගින් ඒකක 6 000 (සේරා) |
| 2020/01/16 | ණයට විකුණුම් එකක් රු. 300 බැගින් ඒකක 1 000 (නාමලී ප්‍රින්ටර්ස්) |
| 2020/01/19 | ආපසු එවුම් ඒකකයක් රු. 300 බැගින් ඒකක 400 (විදුර) |
| 2020/01/20 | ප්‍රචාරණ ගෙවීම රු. 30 000 |
| 2020/01/21 | අත්පිට විකුණුම් රු. 360 ලකුණු කල මිලෙන් 10% අඩු කර ඒකක 200 යි. |
| 2020/01/23 | ගොඩනැගිලි වාර්ෂික ක්ෂය රු. 48 000 |
| 2020/01/25 | සේවක වැටුප ගෙවීම රු. 50 000 |
| 2020/01/26 | වැටුප් අත්තිකාරම් ගෙවීම රු. 120 000 |
| 2020/01/27 | යන්ත්‍ර මිලදී ගැනීමේ මූලික ගෙවීම් 120 000 |
| 2020/01/28 | ණයගැති ලැබීම් රු. 180 000 (අඩු කල වට්ටම රු. 20 000 |

**අවශ්‍ය වන්නේ,**

(1) 2020 ජනවාරි මාසයේ ව්‍යාපාර ආරම්භ කිරීමේ ජර්නල් සටහන

(2) 2020 ජනවාරි ගෙවීම් ජර්නලය

(3) 2020 ජනවාරි මාසයේ පොදු ලෙජරය

1. මුදල් පාලන
2. විකුණුම් ගිණුම
3. ගැනුම් ගිණුම
4. ණයගැති පාලන
5. ණය හිමි පාලන

(4) 2020 ජනවාරි මාසයේ කාලච්ජේදයේ වියදම් ලේඛනය **(ලකුණු 20)**

**(මුළු ලකුණු 40)**



Scanned with CamScanner